# උරහිස් විස්ථාපනයක දී අනුගමනය කරනු ලබන හොරිවිල පරම්පරාවේ විශේෂිත ප්‍රතිකාර ක්‍රම

පාරම්පරික වෛද්‍ය එස්.එම්.එච්.විජේසිංහ

උරහිස් සන්ධි ඉහලට , පහලට , හා පැත්තට සිදුවන විස්ථාපනයක දී දර්ශන ,ස්පර්ශන, ප්‍රශ්න ආදී පරීක්ෂණ ක්‍රම මඟින් විස්ථාපනයේ ස්වභාවය හඳුනා ගන්නා අතර රෝගියාගේ මානසික මට්ටම මැනවින් අවබෝධ කොට රෝගියා සන්සුන් කර භග්නය සැකසීමට කටයුතු කිරීම මුල්ම කාර්ය වේ. මෙහි දී ප්‍රථමාධාර වශයෙන් රෝගියා පහසු ආසනයක හිඳුවා අර්ජුනාරිෂ්ඨය අවුන්ස එකක් පානයට ලබා දෙයි. ඉන් බලාපොරොත්තු වන්නේ රෝගියාගේ වේදනාව පහ කිරීමත් හෘදය ආරක්ෂා කිරීම හා විස්ථාපනය සැකසීමේ දී රෝගියාට ඇතිවිය හැකි සංකූලතා තත්ත්ව මඟ හැරීමත්ය.

අවසන්ධිය සන්ධි කිරීමේ දී අභිඝාතය සහිත අත හොඳින් සැහැල්ලු කරවා තද වී ඇති මාංශ පේශි සැහැල්ලු කොට අදාළ උරහිස් සන්ධිය නියමිත දෙසට වම් අත උපයෝගී කර ගනිමින් මඳක් සූර්ණය කොට නිවැරදි ලෙස සකසා ගෙන උපස්ථායකයෙකුට රෝගියාගේ අත මඳක් ඇද අංශක අනූවකින් ඍජුව තබා ගන්නා ලෙස දන්වා වෛද්‍යවරයාගේ අත් දෙකෙහි මහපට ඇඟිලි හා දබරැඟිලි භාවිතයෙන් විස්ථාපනය වූ ඉහළට පහළට හෝ පැත්තට තෙරපමින් රෝගියාගේ අත පහළට දමා වැලමිට සන්ධියෙන් නවා ස්ථාවරව තබනු ලැබේ. අත පහළට දමන අවස්ථාවේ දී විස්ථාපනය වූ කොටස නිසි ආකාරව නියමිත ස්ථානයේ පිහිටවනු ලැබේ.

පසුව හොරිවිල පාරම්පරික වෙදකමෙහි කැඩුම් බිඳුම් ප්‍රතිකාර සඳහා භාවිත කරන විශේෂිත තෛලයක් වූ භග්න සමන තෛලය ආලේප කර මිනිත්තු දහයක් පමණ බාහුවේ පහළ සිට ඉහළට අතගානු ලැබේ. පසුව භග්න සමන තෛලයෙන් පොඟවන ලද රෙදිකඩක් ආබාධිත ස්ථානය මතු පිට අතුරා ඒ මත මැල්ලුම යොදන අතර මෙලෙස ප්‍රතිකාර ආරම්භයේ දී ම මැල්ලුම් වර්ග භාවිත කිරීම හොරිවිල පාරම්පරික වෙදකමෙහි විශේෂ ලක්ෂණයකි. මෙහි දී සන්ධිය ස්ථාවර කිරීම සඳහා කතිර බන්ධනය යොදා ගන්නා අතර වෙලුම් පටි යොදා තද කිරීමට පෙර උරහිස් සන්ධිය වෙනස් වීම වළක්වනු පිණිස පුළුන් වලින් හෝ රෙදි වලින් සකසන ලද ගෝලයක් කිහිල්ලට තබා බඳිනු ලැබේ. මැල්ලුම තැබීමෙන් පසු ඒ මත බන්ධන යෙදීමට පෙර බුලත් ඇතිරීම සිදු කරන අතර එය ද හොරිවිල පාරම්පරික වෙදකමෙහි හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණයකි.

වෙලුම් පටි යෙදීමෙන් පසුව සන්ධිය වඩාත් ස්ථාවර කිරීම සඳහා රැහැන් යෙදීම සිදු කරයි. මෙහි දී සිහින් රෙදි පටි ආධාරයෙන් සන්ධිය මත කොටු ආකාරයේ හැඩයට බන්ධන යොදන ලබන අතර මෙය ද හොරිවිල පාරම්පරික වෙදකමට අනන්‍ය වූ විශේෂ ලක්ෂණයකි.

පසුව වැලමිට සන්ධියෙන් නවා ස්ථාවර කරන ලද අත වෙනස් වීම වැලැක්වීම පිණිසත් සන්ධියට ආධාරකයක් වශයෙනුත් ත්‍රිකෝණාකාර ලෙස සැකසූ රෙදි කඩක් භාවිතයෙන් උරමාව යොදනු ලැබේ.

මෙම ප්‍රතිකාරය දින දෙකකට සීමා වන අතර පසුව බන්ධන ඉවත් කර අනෙක් ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබන අතර අත ඒ ආකාරයෙන් ම වෙනස් නොකර තබා ගත යුතුය.

පසුව තැවිලි පොට්ටනියකින් මිනිත්තු 20ක් පමණ තැවීම සිදු කරනු ලබන අතර ඒ සඳහා ඉරමුසු මුල්, සුදු ළූණු, මී ඇට, කොට්ටපොල්, පොල්පලා, අබ, වදකහ, වියළි ඉඟුරු, ගම්මිරිස් සම ප්‍රමාණයෙන් ම භාවිත කරනු ලැබේ. මෙම තැවිල්ල දින 14 ක් භාවිත කරනු ලබන අතර එම කාලය තුළ දී මුල් දින 7තුළ සූරිය කොළ පොතු මැල්ලුමත් දෙවනුව

කිරිවැල් කොළ පොතු මැල්ලුමත් භාවිත කරයි. මැල්ලුම සඳහා සූරිය කොළ පොතු, බැලතණ, හාතාවාරිය කොළ, කැටකෑල පොතු, අමුකහ හා පොල් භාවිත කරන අතර දෙවන මැල්ලුම සඳහා කිරිවැල් කොළ පොතු, කොබ්බෑ කොළ පොතු, බැලතණ, අමුකහ හා පොල් භාවිත කරයි.

මෙහි දී තැවීමට පෙර තල තෙල් භාවිත කිරීමේ ප්‍රධාන අරමුණ ලෙස අභිඝාත ස්ථානයේ වාත වේදනා සමනය කිරීමත් මාංශ පේශි ලිහිල් ව තබා ගැනීම හා සුව කිරීමට අවශ්‍ය කැල්සියම් ප්‍රමාණය මුල් අවස්ථාවේ සිට ම ලබා දීම වශයෙන් හඳුනා ගත හැක. මැල්ලුම යෙදීමට ප්‍රථම හැම විට ම භග්න සමන තෛලය භාවිත කරන අතර එමඟින් අභ්‍යන්තර රක්තස්‍රාව වළකන අතර ප්‍රදාහ තත්ත්ව සමනය කරමින් සන්ධි යථා තත්ත්වයට පත් වීමට අවශ්‍ය ඖෂධීය ගුණය ඉක්මනින් ලබා දීමට කටයුතු කරයි.

මෙම ප්‍රතිකාර සිදු කරන අතරතුර රෝගියාගේ දෝෂ කෝප තත්ත්වය සලකා බලා අභ්‍යන්තර ඖෂධ ලබා දීම සිදු කරයි. එහි දී අභ්‍යන්තර රුධිර වහනය වීම වැලැක්වීම, සංචිත රුධිරය ඉවත් කිරීම, ප්‍රදාහය වැලැක්වීම හා පෝෂණයට අවශ්‍ය කැල්සියම් පදාර්ථ ලබා දීමේ අරමුණින් කෛශෝර් ගුග්ගුලුව, වෙනිවැල් ගැට, සුදු ළූණු, තම්බා ගත් අනුපානයෙන් ලබා දෙයි. රෝගියාගේ උණුසුම ආරක්‍ෂා කිරීම වේදනාව පහ කිරීම මෙම අනුපානය ලබා දීමේ අරමුණ වෙයි.

සන්ධිය නිසියාකාරව සැකසීම සඳහා අවශ්‍ය කැල්සියම් චූර්ණ පදාර්ථ සැපයීමේ අරමුණින් තාලිසාදී චූර්ණය ද මෙම කාලය තුල ප්‍රමේහ තත්ත්ව රහිත රෝගීන් සඳහා මී පැණියෙන් උදේ සවස ලබා දෙයි. තාලිසාදී චූර්ණයේ අන්තර්ගත උණකපුරු හොඳ කැල්සියම් ප්‍රභවයකි. රෝගියාගේ වේදනාව සමනය කිරීම සඳහාත් රුධිර සංසරණය ක්‍රමවත් කිරීම සඳහාත් අර්ජුනාරිෂ්ඨය, දශමූලාරිෂ්ඨය හා බලාරිෂ්ඨය සම ප්‍රමාණයෙන් මිශ්‍ර කර අවුන්ස 01ක් දවල්ට හා රාත්‍රියට කෑමට පසුව ලබා දෙන අතර වේදනාව සමනය කිරීමත් ප්‍රදාහය වැලැක්වීමත් අරමුණු කර ගනිමින් රාත්‍රියට නවරත්න කල්කය ලබා දෙයි. මෙය තුන් දොසින් උපන් වේදනා සමනය කරයි.

කැටකෑල පොතු, මාදං පොතු, කහට පොතු, අංකෙන්ද කොළ පොතු මේවා සමව ගෙන කොටා වතුර බෝතල් 06ක් දමා තම්බා මිරිකා ඉස්ම බෝතල් 03ක් ගෙන එයට අරළු, බුළු, නෙල්ලි, තිත්ත අබිං, කයිප්පු, ගම්මිරිස්, කළුදුරු, පුස් ඇට මද, වද කහ, වියළි ඉඟුරු, පෙරුංකායං, සහිඳලුණු, සූදුරු, අසමෝදගම්, වියන්දුඹුළු, ගෙරිපස් මේවා කලං 02 බැගින් ගෙන කුඩු කර බෙහෙත් වතුරට දිය කර මී පැණි අවුන්ස 02ක්, කුරක්කන් පිටි 400, කැකුළු හාල් කැඳ වතුර පීරිසි කෝප්ප 02ක්, බිත්තර 03ක සුදු මද, බෝමී පොතු යුෂ පීරිසි කෝප්ප 04ක්, සීල් අරක්කු මේස හැඳි 02ක් දමා ලිප තබා උණු කර ගැනීමෙන් කැටකෑල පත්තුව සකසා ගනී.

පසුව මෙම ප්‍රතිකාරයෙන් දින 14කට පසුව උඳු පත්තුව යෙදීම සිදු කරන අතර තල තෙල් ගා තවා පෙර පරිදිම භග්න සමන තෛලය ආලේප කරයි. තැවීම සඳහා බෙලි පොතු, සූදුරු, මී ඇට, කොට්ටපොල්, කපු ඇට, එඬරු මුල්, වියන්දුඹුළු භාවිත කරන අතර මී පොතු, කැටකෑල පොතු, මාදං පොතු, අංකෙන්ද කොළ පොතු, කහට පොතු යන මේවා සමව ගෙන වතුර බෝතල් 06ක් දමා තම්බා මිරිකා ඉස්ම බෝතල් 03ක් ගෙන එයට උඳු ඇට, කුරක්කන් ඇට, ඕලු හාල් ආදිය ග්‍රෑම් 100ක් ද වියළි ඉඟුරු, ගම්මිරිස්, කළුදුරු, සූදුරු, අසමෝදගම්, කරාබුනැටි, වසාවාසි, සාදික්කා, වදකහ, වියන්දුඹුළු, ගෙරිපස් යන මේවා ග්‍රෑම් 5 බැගින් ද ගෙන කබලේ බැද කුඩු කර බෙහෙත් ඉස්මට දිය කර බිත්තර 03ක සුදුමදය, මී පැණි අවු 02, කැකුළු හාල් කැඳ වතුර පීරිසි කෝප්ප 02, බෝ මී පොතු යුෂ පීරිසි කෝප්ප 04, සීල් අරක්කු මේස හැඳි 02 ක් ද දමා ලිප තබා උණු කර පත්තුව සාදා ගනී.

පත්තු බැඳීමට පෙර තෙල් ගා තවා බෙහෙත් තෙල් ගැල්විමෙන් පසු මිනිත්තු 10 ක් පමණ අත ඉහළට පහළට, පැත්තට හා සෙමින් කරකවමින් ව්‍යායාම කිරීම සඳහා රෝගියාට

උපදෙස් දෙනු ලැබේ.මෙලෙස පත්තු යෙදීමේ ප්‍රධාන අරමුණ වන්නේ හානි වූ පටක කොටස් නැවත සන්ධිය ප්‍රකෘතිමත් කර ස්ථාවර කිරීමත්, නැවත එලෙස නොවන පරිදි ශක්තිමත් කිරිමත් ය.

මෙම ප්‍රතිකාර දින 28ක් සිදු කරන අතර එම කාළය තුළ වේදනා සමනය කිරිමට නහර ශක්තිමත් කිරීමට යෝගරාජ ගුග්ගුලුව, බැබිල මුල් -සුදුළූණු තැම්බූ වතුරෙන් උදේ/ සවස ලබා දෙයි. රෝගියාට කළු කෝප ලක්‍ෂණ පවතී නම් උණුසුම් ජලයෙන් ලබා දිය හැකිය. අධික වේදනාව පවතී නම් කුච්ල වටිය ගුලි 02ක් රාත්‍රි නින්දට පෙර ලබා දෙන අතර අර්ජුනාරිෂ්ටය, බලාරිෂ්ටය හා දශමූලාරිෂ්ටය පෙර පරිදිම ලබා දීමට කටයුතු කරයි. මෙම කාලය තුල කෂාය ලෙස රාස්නා සප්තක කෂාය, ඒරණ්ඩ සප්තක කෂාය, රාස්නා දශමූලය ආදී කෂාය ලබා දිය හැකිය.

මෙම ප්‍රතිකාර සිදු කිරීමෙන් පසු මාසයක් යන තුරු නාරායන, මහාමාෂ, පිණ්ඩ , මි තෙල් ආදිය මිශ්‍ර කර සාදා ගත් පෝෂණ තෙලක් ආලේප කර බාහුවේ පහල සිට ඉහළට හොඳින් අත ගා පෝෂණ තැවිල්ලකින් (දොඹ ඇට තැවිල්ල යොදා ගත හැක) තැවිම කළ යුතු ය.

මෙමගින් රෝගියාගේ හානි වූ පටක තව දුරටත් ප්‍රකෘතිමත් කරන අතර නහර, කණ්ඩරා, ස්නායු යථා තත්ත්වයට පත් කර තවදුරටත් වේදනා සමනය කරයි. රක්ත සංවහනය ක්‍රමවත් වන අතර සන්ධියට අවශ්‍ය පෝෂණය තව දුරටත් ලබා දෙමින් සන්ධිය හා මාංශ පේශි ස්නිග්ධ කරමින් සන්ධියේ ක්‍රියාකාරිත්වය පහසු කරයි. මෙම ප්‍රතිකාරය ආරම්භ කිරීමත් සමග තෙල් කිර සැකසීම සිදු කළ යුතු අතර එය මාසයක් යන තුරු අව්වෙන් කකාරා ගත යුතු ය. ඉහත ප්‍රතිකාරයෙන් පසු තවත් මාසයක් යන තුරු සකසා ගන්නා ලද තෙල් කිර ආලේප කළ යුතුය.

නව හන්දි, පනම් පෙති, බුරුල්ල කොළ, එරඬු කොල, ගිරිතිල්ල කොළ, වැල්පෙනෙළ කොළ, කඩුපහර කොළ, පෝටා කොළ, හාතවාරිය කොළ, ළපටි පොල් පළා, ළපටි පුවක් මල්, ඇහැල පොතු, තෝර කොළ, බැලතණ, දූල් පොඩි කොළ යන මේවා සමව කොටා වතුර බෝතල් 1/2 ක් දමා ඉස්ම මිරිකා ගෙන පිත්තල හෝ තඹ බඳුනක දමා පැසුණු පොල් ගෙඩි 02ක මිටිකිරි, තලතෙල් අවු 01, එරඬු තෙල් අවු 01, දොඹ තෙල් අවු 01 බැගින් දමා කළුදුරු කුඩු 20 ට දමා අව්වේ මාසයක් කකාරා ගැනීමෙන් එම තෙල් කිර සාදා ගනී. මෙම තෙල් කිර ආලේප කිරීම මගින් අභිඝාත ස්ථානයේ පටක තවදුරටත් ප්‍රකෘතිමත් කරන අතර රුධිර සංසරණය ක්‍රමවත් වීමත්, සන්ධිය ස්ථාවර වීමත් වේ. විශේෂයෙන්ම මෙමගින් සන්ධියේ ඇති වන ස්තබ්ධතා නැති කර සන්ධියේ තද වීම් දුරු කර මාංශ පේශි ඉහිල් කර සන්ධියේ මනා ක්‍රියාකාරිත්වය ඇති කරයි.

මෙම කාලය අතර තුර කෂාය වර්ග ලබා දීමද විශේෂයෙන් සිදු කරන අතර මුල් දින 07 තුළ නික 12 කෂායත් දෙවනුව මධුයෂ්ටි නිශායුග්ම කෂායත් භාවිතා කරයි.

වේදනාව සමනය කිරීම හා ඇති විය හැකි අනෙකුත් සංකූලතා මග හැරීම මෙම කෂාය ලබා දීමේ ප්‍රධාන අරමුණයි. මධුයෂ්ටි නිශායුග්ම කෂායේ වැල් මී, වියළි කහ ,වෙනිවැල්ගැට ,පළොල් ,ඇහැල, කලාඳුරු,කොහොඹ යන ඖෂධ අන්තර්ගත වන අතර අභ්‍යන්තර රක්ත වහනය වැලැක්වීම රුධිර සංසරණය ක්‍රමවත් කිරීම ප්‍රදාහ තත්ව සමනය කිරීම මෙම කෂාය ලබා දීමේ අරමුණවේ . දින 14කට පසුව අවසන්ධි ස්ථානය පරීක්‍ෂා කර බලා පත්තු යෙදීම ආරම්භ කරන අතර මුලින් කැටකෑල පත්තුවත් දින 14කට පසු උඳු පත්තුවත් යොදනු ලැබේ.

පත්තු යෙදීමට ප්‍රථම උණුසුම් කරන ලද තල තෙල් ගා මිනිත්තු 10 ක් පමණ ඉහළට පිරිමැදීමත් පසුව තැවීමත් සිදු කරනු ලැබේ. කැටකෑල පත්තුව යෙදීමට ප්‍රථම ඉරමුසු තැවිල්ලෙන් තැවීම සිදු කරන අතර ඒ සඳහා ඉරමුසු මුල්, සුදු ළූණු, මී ඇට, කොට්ට පොල්, පොල්පලා, අබ, වද කහ, වියළි ඉඟුරු, ගම්මිරිස් වලට අමතරව එරඬු මුල් හා සතකුප්ප ද මිශ්‍ර කර ගනී.

මෙම කාලය තුළ රෝගියා නිවැරදි පත්‍යාපත්‍ය විධි අනුගමනය කළ යුතු අතර ඒ පිළිබඳව රෝගියා හොඳින් දැනුවත් කළ යුතුය. මුල් කාලයේ දී අත නොසොල්වා තබා ගැනීමත්, නිතර උරමාව පැළඳ සිටීමත් අනිවාර්ය වේ. එම අත භාවිතා කර කිසිදු කාර්යයක නිරත වීම සුදුසු නොවන අතර ඇඟිලි නැමීම, දිග හැරීම නිතර කිරීම සුදුසු ය. මෙම කාලය තුළ අඹ, අන්නාසි, අච්චාරු, තක්කාලි, ඉස්සෝ, දැල්ලෝ, සැමන්, බල මාළු, බල කරවල, මැංගුස්ටින්, දූරියන්, විනාකිරි වැනි විදාහී ආහාර පළතුරු නොගත යුතු අතර එළකිරි, බිත්තර, කුඩා මාළු, හාල් මැස්සන්, මුරුංගා වැනි කැල්සියම් පදාර්ථ බහුල ආහාර තම්පලා, සාරණ, තලන බටු, බණ්ඩක්කා වැනි ආහාර නිතර ගැනීම සුදුසු ය.

මෙම වෙද හෙද ප්‍රතිකාර මෙන්ම පත්‍යාපත්‍ය විධි නිසි පරිදි අනුගමනය කිරීමෙන් විස්ථාපනය වූ උරස් සන්ධිය නැවත පෙර තිබූ ආකාරයෙන්ම ප්‍රකෘතිමත් තත්ත්වයට සකසා ගත හැකි වනු ඇත.